
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.

5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2018

ප්‍රශ්න පත්‍ර අංක 03 - I පත්‍රය


විභාග අංකය : ..... **කාලය : මිනිත්තු 45**

01) අංක 1 හා 2 ප්‍රශ්නවල දී ඇති රූප අතරින් නොගැළපෙන රූපය තෝරන්න.



(1) (2) (3)

02)



(1) (2) (3)


03) පහත දැක්වෙන ගැටලුවේ කොටුව තුළ ඇති සංඛ්‍යා වෙනුවට ආදේශ කළ හැකි සංඛ්‍යා සහිත පිළිතුර තෝරන්න.

75 + [6 × 6] + 9 = 120

(1) 4 × 8 + 4 (2) 5 × 6 + 4 (3) 11 × 3 + 4

04) පහත අකුරු රෝදය අංක 1 න් පටන් ගෙන රේඛාව දිගේ ඉදිරියට පෙරළන විට හමුවන ? ලකුණට ගොඩනැගෙන සංඛ්‍යාව වන්නේ,





(1) 3 5 6 8 2 (2) 2 4 6 8 2 (3) 3 5 7 8 2

05) පහත දී ඇති වාක්‍ය අතුරෙන් නිවැරදිව ලියා ඇති වාක්‍ය තෝරන්න.

(1) සරුංගල් අහසේ පවෙයි.

(2) සරුංගල් අහසෙ පවෙයි

(3) සරුංගල් අහසේ පාවෙයි.

06) වෛද්‍යවරයෙකුට තිබිය යුතු හැකියාව වන්නේ,

(1) රෝගය හඳුනාගෙන බෙහෙත් දීම ය.

(2) රෝගීන් සුවපත් කළ හැකි ආකාරයට බෙහෙත් ලබා දීම ය.


(3) රෝගය හඳුනාගෙන ප්‍රතිකාර කර රෝගීන් සුවපත් කිරීම ය.


07) පහත සංඛ්‍යා රටාවේ හිස්තැනට තිබිය යුතු සංඛ්‍යාව වන්නේ,

230. 220, 211, 203, ... , 190

(1) 196 (2) 213 (3) 193

08) පහත සංඛ්‍යා රටාවේ A සඳහා තිබිය යුතු සංඛ්‍යාව වන්නේ,








(1) 4 (2) 12 (3) 16

09) මෙහි මුලින් දී ඇති වචන යුගලෙහි වචන දෙක අතර කිසියම් සම්බන්ධතාවයක් ඇත. එසේ සම්බන්ධතාවයක් ඇති වචන යුගලය පහත යුගල අතරින් තෝරා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

පොත - කවරය

(1) ගෙය - වහලය (2) කොට්ටය - උරය (3) පිහිය - මිට

10) පහත දී ඇති කොටුවේ සඳහන් සංකේත ඇසුරින් 10 - 11 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



යහපත් දරුවෙකුගේ ලක්ෂණයක්, ප්‍රකාශවන සංකේත යුගලය ලියන්න.

(1) 

(2) 

(3) 


11) ක්‍රියා පදය සඳහා යෙදී ඇති සංකේත වන්නේ,

(1) 





(2) 

(3) 

12) සමමිතික රේඛා දෙකකට වඩා තිබිය හැකි රූපය තෝරා යටින් ඉරක් අඳින්න.


(1) 
(2) 
(3) 

13) කඩදාසිය හතරට නවා කොටසක් කපා ඇති ආකාරය පහත දක්වේ. මෙම කඩදාසිය දිග හැරිය විට දක ගත හැකි ආකාරය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) (2) (3)

14) මෙම රූපයේ දක්වෙන ත්‍රිකෝණ සංඛ්‍යාව කීයද? පිළිතුරෙහි අංකය රවුම් කරන්න.



(1) 7
(2) 6
(3) 8

15) පහත දක්වෙන දේ අතුරින් ගෝලය හැඩය ඇති දෙයක අදාළ පිළිතුර යටින් ඉරක් අඳින්න.


(1) පොල් ගෙඩිය (2) බිත්තරය (3) රබර් බෝලය

16) අද සිකුරාදා ය. පෙරේදා 2 වැනි දාය. අනිද්දා මගේ උපන් දිනය යෙදී ඇත. මගේ උපන් දිනය යෙදෙන දිනය සහ දවස තෝරා යටින් ඉරක් අඳින්න.

(1) 3 වන බ්‍රහස්පතින්දා (2) 6 වන ඉරිදා (3) 5 වන සෙනසුරාදා

17) වෙරළු ගෙඩි 306 ක් මා ළඟ තිබුණි. මමත් මිතුරන් පස් දෙනාත් ඒවා සමසේ බෙදා ගත්තෙමු. අපෙන් එක් අයෙකුට වෙරළු ගෙඩි කීයක් ලැබේ ද?

(1) 61 කි. (2) 51 කි. (3) 56 කි.

18) 


මෙවැනි කොටු 8 ක වර්ගඵලය වනුයේ,

(1) 4 cm^2 (2) 32 cm (3) 32 cm^2

19) පාසලේ පැවති උත්සවයක දී මාර්ගයේ එක් පසෙකින් විදුලි කණු දෙකක් අතර කොඩි කණු තුනක් සිටුවීමට තීරණය විය. එහි තිබූ විදුලි කණු ගණන 8 කි. අවශ්‍ය කොඩි කණු ගණන කීයද?

(1) 21 කි. (2) 24 කි. (3) 27 කි.

- පහත රූප සටහනේ ගණිතයට කැමති සිසුන් වෘත්තයෙන් ද මව්බසට කැමති සිසුන් ත්‍රිකෝණයෙන් ද පරිසරයට කැමති සිසුන් සෘජුකෝණාස්‍රයෙන් ද දක්වේ. ඒ ඇසුරින් අසන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.



20) විෂයන් තුනට ම කැමති සිසුවා හෝ සිසුවිය කවුද?
(1) හසිනි (2) කවීෂා (3) සනාදී

21) මව්බසට හා පරිසරයට කැමති නමුත් ගණිතයට අකමැති සිසුවා හෝ සිසුවිය සොයන්න. පිළිතුරට යටින් ඉරක් අඳින්න.
(1) සමන් (2) කවීෂා (3) පියල්

22) සමන් කැමති විෂය වන්නේ,
(1) මව්බස (2) ගණිතය (3) පරිසරය

23) මා ළඟ තිබූ මුදලින් හරි අඩක් වියදම් කර ඉතිරි වූ මුදලින් රුපියල් 30 ක් වියදම් කර කොපි පොතක් ගත් පසු රුපියල් 50 ක් ඉතිරි විය. මා ළඟ මුලින් තිබූ මුදල කොපමණ ද?
(1) රුපියල් 130.00 (2) රුපියල් 160.00 (3) රුපියල් 260.00

24) නගරබද ප්‍රදේශවල ඩෙංගු උවදුර ව්‍යාප්ත වීමේ ප්‍රවණතාව වැඩි බව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා පවසයි. මෙයට හේතු විය හැක්කේ,
(1) ගම්බද ප්‍රදේශවල මදුරුවන් බෝ නොවීම.
(2) නාගරික ප්‍රදේශවල ජලය රැඳී පැවතීමේ ඉඩකඩ ඇති ස්ථාන වැඩි වීම.
(3) නාගරික ප්‍රදේශවලට මදුරුවන් කැමති වීම.

25) මම සංඛ්‍යාවක් සිතුවෙමි. එයට 12 ක් එකතු කර 5 ක් අඩු කළ විට පිළිතුරේ දෙගුණය 28 නම් මා සිතූ සංඛ්‍යාව කීය ද?
(1) 21 (2) 3 (3) 7

26) තාත්තා අවදි වූයේ අම්මාට වඩා පැය භාගයකට පෙර ය. අම්මා අවදි වී මිනිත්තු 15 කින් මම අවදි වුණෙමි. මම අද කාටත් වඩා උදෙන් අවදි වූවා යයි අක්කා මා සමඟ කීවා ය එසේ නම් අවසානයට අවදි වූයේ කවු ද?
(1) අක්කා ය. (2) තාත්තා ය. (3) මම ය.

27) 80 ත් 90 ත් අතර ඇති ඉරට්ටේ සංඛ්‍යා ගණන හා ඔත්තේ සංඛ්‍යා ගණන පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) 4 හා 5 (2) 6 හා 5 (3) 5 හා 4

28) පෙබරවාරි මාසයේ සතියේ සෑම සඳුදා දිනකම උෂාරා පුස්තකාලයට යයි. දවස් තුනකට වරක් උෂාරා පුස්තකාලයට යයි. 5 වන සඳුදා දෙදෙනාම එකවර පුස්තකාලයට ගියේ නම් නැවත දෙදෙනාම එකවර පුස්තකාලයට යන දිනය වන්නේ,

(1) පෙබරවාරි 12 (2) පෙබරවාරි 26 (3) පෙබරවාරි 05

29) මිනිසෙකුට වැඩක් කිරීමට දින 21 ක් ගත වේ. එම වැඩ කොටස නිම කිරීමට මිනිසුන් තිදෙනෙකුට දින කීයක් ගත වේද?

(1) දින 7 ක් (2) දින 28 ක් (3) දින 14 ක්

30) පහත සඳහන් මාස අතරින් හරි මැද දින දෙකක් ඇති මාසය තෝරන්න.

(1) ජනවාරි (2) අප්‍රේල් (3) දෙසැම්බර්


31) 2018 වර්ෂයේ දී ලෝක පරිසර දිනය යෙදී ඇත්තේ ජූනි 05 වන දාට ය. ජනවාරී 01 දා සිට ලෝක පරිසර දිනය දක්වා දින කීයක් තිබේ ද?

(1) 186 (2) 167 (3) 156

32) මලිදු උතුරු දෙසට මුහුණලා සිටිනා විට ඔහුගේ සෙවනැල්ල ඇත්තේ ඔහුගේ වම් අත පැත්තේ ය. එසේ නම් මෙම වේලාව විය හැක්කේ,

(1) පස්වරු 3.30 (2) පස්වරු 5.00 (3) පෙරවරු 8.00




33) එක සිට හය දක්වා අංක යෙදූ විවිධ පාටින් යුත් ඝනක තුනක් පහත දක්වා ඇත.



මෙහි අංක 6 ට විරුද්ධ පැත්තේ ඇත්තේ කුමන ඉලක්කම ද?

(1) 1 (2) 3 (3) 4

34) පහත දී ඇති රූප තුනෙහි ත්‍රිකෝණ සියල්ල ම සමාන ය. එම රූපවල ඇති තිත් ඉරි දිගේ නැවීමේ චතුස්තලයක් සාදා ගත නොහැකි රූපය යටින් ඉරක් අඳින්න.

(1)  (2)  (3) 

පහත දක්වෙන තොරතුරු හොඳින් කියවන්න.

අඹ 1 ක් දොඩම් 2 ක්	අඹ 2 ක් දොඩම් 3 ක්
රුපියල් 70.00	රුපියල් 120.00

35) අඹ ගෙඩියක හා දොඩම් ගෙඩියක මිල විය හැක්කේ,

(1) රුපියල් 50.00 (2) රුපියල් 60.00 (3) රුපියල් 70.00

36) තරුෂ ගෙන ආ මල් වට්ටියේ තිබූ මල් පහත සඳහන් පරිදි වෙයි.


සුදු මල් 12 - සුදු පාට නොවන මල් 14

වතු සුදු මල් 5 - රෝස මල් 2

මේ අනුව මල් වට්ටියේ තිබූ මල් ගණන කීයද?

(1) 26 (2) 33 (3) 31


37) මෙම රූපයේ ඇති පේළි හා තීරු ගණන පිළිවෙළින් දක්වෙන පිළිතුර වන්නේ,



(1) 4 X 5 (2) 4 , 5 (3) 5 , 4

38) ගණක රාමුවක එක් ස්ථානීය අගයකට භාවිත කළ හැකි උපරිම ගණක සංඛ්‍යාව භාවිතා කර සෑදිය හැකි ඉලක්කම් හතරේ විශාල ම සංඛ්‍යාව වන්නේ,

(1) 9 000 (2) 9 999 (3) 10 000

39) 

නම්,

පිළිතුර

(1) 66 (2) 80 (3) 70

40) පහත රූප පේළියේ දක්වෙන රටාව අනුව හිස්තැන්වලට ආ යුතු රූප යුගලය වන්නේ,



(1)  (2)  (3) 

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.

5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2018

ප්‍රශ්න පත්‍ර අංක 03 - II පත්‍රය

විභාග අංකය : ..... **කාලය : පැය 1යි මිනිත්තු 15**

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

පිටරටියන්ගේ දේ අගය කරමින් නිවට ලෙස කල් ගෙවූ ලංකාවාසී වැඩිහිටියන් තුළ පමණක් නොව කුඩා දරුවන් තුළ ද රට, ජාතිය, ආගම කෙරෙහි ඇල්මක් ඇති කිරීමට නොකිය ව සිය පෑන මෙහෙය වූ ටිබෙට් ජාතික ඇස්.මහින්ද හිමියෝ ක්‍රි.ව. 1951 මාර්තු 16 වන දා රාත්‍රී 8.00 ට පමණ මෙලොවින් සමු ගත්හ.

(1) මෙම ඡේදයෙන් කියවෙන්නේ කවරෙකු ගැන ද?

.....

(2) ඔහු කිනම් ජාතිකයෙක් ද?

.....

(3) "ස්වදේශිකයන්" යන්නට විරුද්ධාර්ථ පදය ඡේදයෙන් තෝරා ලියන්න.

.....

(4) "ජාතිය කෙරෙහි ඇති ඇල්ම" යන්නට ඔබ දන්නා තනි පදයක් ලියන්න.

.....

(5) ඔහු කවි ලීවේ කුමක් සඳහා ද?

.....

(6) "අපවත් වූහ" යන්න ඡේදයේ යෙදී ඇත්තේ කෙසේ ද?

.....

(7) "ශ්‍රී ලාංකික" යන්නට යෙදී ඇති යෙදුම කුමක් ද?

.....

(8) මෙහි ඇති කෙටි යෙදුම දිගු කර ලියන්න.

.....

(9) ප්‍රාණවාචී බහුවචන අනුක්ත නාම පද තෝරා ලියන්න.

.....

(10) පිට රට දේ අගය කරනවාට වඩා "..... දේ සිරි සැපදේ" යැයි කියමනක් ඇත.

හිස්තැනට වඩාත් ම ගැළපෙන්නේ (තම රට, සිය රට, මගේ රට)

02) වචන ගළපා අර්ථවත් වාක්‍ය ගොඩනඟා ලියන්න.

(1) වූහ / තේ / මිනිස්සු / පානය / සඳහා / සූදානම්

.....

(2) වෙහෙසෙති / බොහෝ / ගොවියෝ / සතුන්ගෙන් / ගැනීමට / බෙරා / හේන් / තම

.....

03) නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

(1) මාමා හා නැන්දා උදෑසන ම හේනට ..... (යයි / යති)

(2) සුළඟින් තුරු පෙළ ඇද ..... (වැටිණි / වැටෙති)

04) සුදුසු විරාම ලකුණු යොදා පහත දී ඇති වගන්තිය නැවත ලියන්න.

ආදි කාලයේ සිට ම මිනිසා ඉර සහ හඳ කෙරෙහි විශාල භක්තියක් දක්වූවා නේ ද

.....

05) පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

(1) බල්ලෝ බුරන විට හොරු පලා යති.

.....

06) අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය වරහන් තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(1) ක්‍රීඩා උළෙල / ක්‍රීඩා උලෙළ

(2) ප්‍රදර්ශණය / ප්‍රදර්ශනය

07) පහත දී ඇති අදහසට ගැළපෙන තනි වචනය තිත් ඉර මත ලියන්න.

(1) අඳුර ගලා ගෙන එන වේලාව - .....

(2) අශ්වයා නගන හඬ - .....

08) පහත යෙදුම් සම්පූර්ණ වීමට හිස්තැනට යෙදිය යුතු වචනය ලියන්න.

(1) ..... හොරා බෙහෙත් කන්නා වගේ

(2) ..... පෙර සිතා බලන්න.


09) පහත සඳහන් කවියේ ඇති හිස්තැන සම්පූර්ණ කරන්න.

දුර එනකොට වැටකෙයියා මලක් වගේ
ළඟ එනකොට ..... කළ වැඩක් වගේ
ගෙට එනකොට ගෙයි ඇවිලෙන පහන වගේ
මගේ අම්මා මට ..... වගේ

10) පහත දී ඇති ඉංග්‍රීසි වචනය සිංහලෙන් ලියන්න.

(1) rivers - .....

11) පහත රූප වල නම් ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

(1)  ----------

(2)  ----------

12) පහත සඳහන් වාක්‍යයේ අර්ථය ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.
අපි ක්‍රීඩා පිටියට යමු ද? .....

13) පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.
මේ මගේ නංගී - .....

14) පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.
ඉන්නුම් වරවිල්ලෙ - .....

15) "මගේ රටට මම ආදරය කරමි." යන මාතෘකාව පිළිබඳව වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට වැඩි විය යුතුය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.

i. .....

.....

ii .....

.....

iii.....

.....

- දී ඇති හිස්තැන මත පිළිතුරු සපයන්න.

16) මෙම සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

හතළිස් හතර දහස් විසි හත - .....


17) දී ඇති රෝම සංඛ්‍යාවේ පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව රෝම ඉලක්කම් වලින් දක්වන්න.

..... X .....

18) ඊළඟට එන සංඛ්‍යා දී ඇති හිස්තැන් මත ලියන්න.

11, 13, 16, 20, ... , ...

19) රූපයේ අඳුරු කර ඇති කොටස භාගයක් ලෙස ලියන්න.



---

20) $2\frac{5}{10}$ දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.....

21) පහත සඳහන් භාග එකතු කරන්න.

$\frac{2}{5} + \frac{3}{5} =$ .....

22) පිරමිඩයක ඇති දාර ගණන කීය ද? .....

23) පොතක මිල රුපියල් 30 කි. පෑනක මිල රුපියල් 15 කි. පොත් 4 ක් හා පෑන් 03 මිලට ගත් පසු රමණි වෙළෙඳ සැල් හිමියාට රුපියල් 500 නෝට්ටුවක් දුන් අතර ඇයට ඉතිරි මුදල නෝට්ටු 4 කින් හා කාසි 2 කින් ලැබිණි. ඇයට ලැබුණු කාසි 2 මොනවාද?


.....

24) තරිඳු වීදුරු බෝල 290 කින් 20 ක් තමන් ළඟ තබාගෙන ඉතිරිය 6 දෙනෙක් අතර බෙදන ලදී. එක් අයෙකුට ලැබුණු වීදුරු බෝල ගණන කොපමණ ද? .....

25) මෙම රූප සටහන දෙස බලා පිළිතුරු සපයන්න.
පාසලේ සිට තැපැල් කාර්යාලය හරහා සමූපකාරයට ඇති දුර කොපමණ ද?
කිලෝමීටර..... මීටර .....



26) මෙම රූපයේ පරිමිතිය කොපමණ ද?




.....

27) පහත බිල්පත සම්පූර්ණ කරන්න.

ද්‍රව්‍ය	ප්‍රමාණය	1 kg / 1 *l* මිල	මුදල රුපියල්	ශත
සීනි	500 g	90.00	1.	.....
පරිප්පු	250 g	160.00	2.	.....
පොල්තෙල්	250 ml	200.00	3.	.....
		එකතුව	4.	.....

28) 5A , B පන්තිවල සතියක් තුළ සිසුන්ගේ පාසල් පැමිණීම පහත වගුවේ දක්වේ.

දිනය	පැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව
සඳුදා	60
අඟහරුවාදා	55
බදාදා	60
බ්‍රහස්පතින්දා	65
සිකුරාදා	.....



(i) පන්ති දෙකේ ම සිසුන් 35 බැගින් සිටින අතර සිකුරාදා දිනයේ සියලු සිසුන් පාසල් පැමිණ සිටියහ. එය පහත ප්‍රස්තාරයේ ලකුණු කරන්න.

(ii) සතිය තුළ සිසුන්ගේ මුළු පැමිණීම කොපමණ ද?

.....

(iii) සතිය තුළ නොපැමිණි සිසුන් ගණන කොපමණ ද?

.....

29) ටැංකියකට පිරවිය හැකි මුළු ජල ප්‍රමාණය ලීටර 15 කි. එය පිරවීමට පැය 1 මිනිත්තු 15 ක් ගත වේ. දැනට එයට ලීටර 8 ක් පුරවා ඇත. ඉතිරි ප්‍රමාණය පිරවීමට කොපමණ වේලාවක් ගත වේ ද?

.....


- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

30) ආහාරවලට ඇඹුල් රසය ඇති කිරීම එක් කරනු නොලබන්නේ
(1) බිලිං (2) ගොරකා (3) සියඹලා (4) කුරුඳු

31) මිනිසාට ආරථික වාසි ලබා දෙන සත්ත්ව කාණ්ඩය වන්නේ,
(1) මී මැස්සා, ගවයා, කුකුළා (2) ගවයා, එළුවා, මොනරා
(3) ගවයා, කුකුළා, බළලා (4) මී මැස්සා, එළුවා, බල්ලා

32) දම් පාට සාදා ගැනීමට එක් කළ යුතු වර්ණ දෙක වන්නේ,
(1) කොළ + කළු (2) රතු + නිල් (3) නිල් + කොළ (4) දුඹුරු + කහ

33) මෙම ඇටවුමෙන් දැක්වෙන්නේ,
(1) විද්‍යුත් චුම්භකයකි.
(2) කාන්දම් සෙල්ලම් බඩුවකි.
(3) විදුලි පරිපථයකි.
(4) සෙල්ලම් මාර්ග සංඥා පද්ධතියකි.



34) ලී කැටයම් සඳහා ප්‍රසිද්ධ ඓතිහාසික ස්ථානයකි.
(1) ගල් විහාරය (2) අවුකන (3) ඉසුරුමුණිය (4) ඇම්බැක්කේ

35) ජලයට දමා දිය කළ විට හොඳින් දිය වෙන ද්‍රව්‍යයක් නොවන්නේ,
(1) ලුණු (2) සබන් (3) සීනි (4) පොල්තෙල්

36) වගා කිරීම සඳහා ජලය විශාල වශයෙන් අවශ්‍ය වන බෝග වර්ගය වන්නේ,
(1) බඩ ඉරිඟු (2) කව්පි (3) වී (4) කුරහන්

37) ආහාර ගැනීමෙන් සිදු නොවිය යුත්තේ,
(1) ශරීරය ස්ථූල වීම (2) ශරීරය වර්ධනය වීම.
(3) ශරීරය ආරක්ෂා වීම. (4) ශරීරය ශක්තිමත් වීම.

38) රාජ්‍ය ලාංඡනයේ නෙළුම් පෙතිවලින් දැක්වෙන්නේ,
(1) පාරිශුද්ධ බව (2) ස්ථිර බව (3) එඩිතර බව (4) පිරිපුන් බව

39) ඇස හා කන උපයෝගී කරගෙන තොරතුරු ලබා ගන්නා මාධ්‍යයක් වන්නේ,
(1) ගුවන් විදුලිය (2) අන්තර්ජාලය
(3) පුවත්පත් (4) ශබ්ද විකාශන යන්ත්‍ර

40) අප පරිහරණය කරන උපකරණ නිසි තැන තැබීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,
(1) නැවත පරිහරණයට පහසු වේ. (2) කාලය ඉතිරි වේ.
(3) පිළිවෙලකට වැඩ කිරීමට පුරුදු වේ. (4) කසල බඳුනක් අවශ්‍ය නොවේ.

41) අතීතයේ රාත්‍රියේ ගමනක් යද්දී ආලෝකය ලබා ගැනීමට ගෙනයන උපකරණයකි,

(1) හනස්ස (2) පොල් අත්ත (3) හුළු අත්ත (4) ඉටි පත්දම

42) ගලගණ්ඩය රෝගයට ප්‍රධාන හේතුව වන්නේ,

(1) අයඩින් ඌණතාවයයි. (2) යකඩ ඌණතාවයයි.

(3) විටමින් ඌණතාවයයි. (4) කැල්සියම් ඌණතාවයයි.

43) උණ දඬු කපන තැන උණ දඬු රිකිල්ලා
බට දඬු කපන තැන බට දඬු රිකිල්ලා
මෙම කවිය අයත් වන්නේ,

(1) පතල් කර්මාන්තයට ය. (2) කෘෂි කර්මාන්තයට ය.

(3) ධීවර කර්මාන්තයට ය. (4) කෙලි ගී වලට ය.

44) සහල්වල ඇති දහයියා ඉවත් කර ගැනීමට වඩාත් උපකාර වන්නේ,

(1) කුල්ල (2) නෑඹිලිය (3) ඇතුල්පත (4) කොරහ

45) උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක ගණන වන්නේ,

(1) 02 (2) 03 (3) 04 (4) 05

46) පොතක කියවීමට අවශ්‍ය මාතෘකාව තෝරා ගැනීමේ දී ඊට උපකාර වන්නේ,

(1) සිරස්තලයයි. (2) පෙරවදනයි (3) පටුනයි (4) පරිච්ඡේදයයි

47) "අහසින් වැටෙන එක් දිය බිඳක් හෝ නිකරුණේ මුහුදට යාමට ඉඩ නොදෙන්න." මෙම ප්‍රකාශය කළේ,

(1) දුටුගැමුණු රජතුමා (2) පරාක්‍රමබාහු රජතුමා

(3) මහසෙන් රජතුමා (4) අභය රජතුමා

48) ඉංග්‍රීසීන්ට විරුද්ධව යුද්ධ කොට රට බේරා ගැනීමට කටයුතු කළ ජාතික වීරවරයෙක් නොවන්නේ,

(1) ගොංගාලේ ගොඩ බණ්ඩා (2) මොනරවිල කැප්පෙටිපොළ

(3) මොල්ලිගොඩ දිසාවේ (4) මද්දුම බණ්ඩාර

49) ශරීරය වර්ධනය කරන ආහාර කාණ්ඩයක් වන්නේ,

(1) දඹල, සෝයා බෝංචි, මාළු (2) දඹල, සෝයා බෝංචි, කුරහන්

(3) දඹල, සෝයා බෝංචි, දෙල් (4) සෝයා, මුං, බිත්තර

50) බීජ සමඟ ආහාරයට ගන්නා එළවළුවක් වන්නේ,


(1) මුරුංගා (2) වට්ටක්කා (3) පතෝල (4) කැකිරි

51) පහත රූපික ප්‍රකාශනය මගින් දැක්වෙන්නේ,



(1) විදුලිය විසන්ධි කර ඇත.
(2) විදුලි කණුවක් ඉදිරියෙන්
(3) ඉදිරියෙන් දකුණට හරවන්න.
(4) විදුලියෙන් අනතුරු ඇති වේ.

52) පහත දැක්වෙන තරු රටාව වන්නේ,



(1) සිංහ
(2) ඔරායන්
(3) දඩයක්කාරයා
(4) කුඩා වලසා

53) පහත රූපයෙන් දැක්වෙන ගමන් විලාසය වන්නේ,



(1) දෙමලිච්චා
(2) දළඹුවා
(3) අශ්වයා
(4) කුඩැල්ලා

54) දේදුන්නේ දැකිය හැකි වර්ණ ගණන වන්නේ,

(1) 05 (2) 07 (3) 12 (4) 08

55) ශ්‍රී ලංකා සිතියමේ රතු පැහැති රේඛා වලින් දැක්වෙන්නේ,

(1) මහා මාර්ග (2) දුම්රිය මාර්ග (3) අධිවේගී මාර්ග (4) අතුරු මාර්ග

56) පස සේදී යාම වළක්වාලීමට නොකළ යුතු වන්නේ,

(1) කාණු දැමීම. (2) පිඩලි ඇල්ලීම
(3) තණකොළ ගැලවීම (4) ගල් වැටි දැමීම.

57) ශ්‍රී ලංකාවේ වී වගා කරන කන්න දෙක වන්නේ,

(1) යල, මහ (2) ඊසාන දිග, නිරිත දිග
(3) උතුර , දකුණ (4) පුර, අව

58) ගඟක් මුහුදට වැටෙන ස්ථානය හඳුන්වන්නේ,

(1) කලපුව (2) මෝය (3) බොක්ක (4) ශිඛරය

59) ධීවර කර්මාන්තයේ දී හා පෙදරේරු කර්මාන්තයේ දී යොදා ගන්නා උපකරණ දෙකක් අනුපිළිවෙළින් දැක්වෙන්නේ,

(1) අතංගුව හා මාදුල (2) අතංගුව හා මනිස්ලෑල්ල
(3) මාදුල හා කිණිහිරය (4) මාදුල හා වරක්කලය